විද්‍යාලය :- තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය :- 12 ශ්‍රේණිය පැවරුම්

බැද්දේගම නවකතාව

විෂය භාර ගුරු :- ඕ.එම්.එන්.කරුණාරත්න

**01.බැද්දේගම නවකතාවේ පසුබිම් නිරූපණය පිළිබඳව සනිදර්ශනව දක්වන්න?**

<u>පිළිතුර ලිවීමට අත්වැලක්</u>

☞_බැද්දේගම නවකතාවේ පරිසර වර්ණනා කෙරෙන ස්ථාන කිහිපයක් නිදසුන් ලෙස ගන්න.

( බැද්දේගම , වනාන්තරය )

- ‘‘මහ මුහුදටත් කඳු වැටිවලටත් අතර පහත රට තැනිතලා ප්‍රදේශයක පිහිටි ගමකි ‘බැද්දේගම’...”
- “වන මැදින් වැටී තිබෙන අඩි පාරවල මුළු දවසේ ම ගමන් කළත් පණ ඇති කිසිම සතෙක් එහි දකින්නට නොලැබේ.”

☞පසුබිම් නිරූපණය නව කතාවේ කතා වින්‍යාසය කෙරේ බලපාන අයුරු පැහැදිලි කිරීම

☞පාඨකයාට කතාව කියවීමට හා  කතා රසය ඉස්මතුවන අයුරු දැක්වීම.

☞කතකයාගේ මූලික තේමවට පසුබිම් නිරූපණයේ දායකත්වය .

☞අවස්ථාවට හා සිද්ධියට පසුබිම් නිරූපණයේ ඇති ඖචිත්‍යබව(උචිත බව )

☞වියලි කලාපය හා බැඳුණු පසුබිම් පිළිබඳ කතුවරයා තුළ වූ ගැඹුරු නිරීක්ෂණය .

☞පසුබිම් නිරූපණය කෙරේ යොදාගෙන ඇති සංකේත දැක්වීම.

☞ඒ ඒ පසුබිම් නිරූපණයන්(බැද්ද,ගම,විවිධ සිද්ධිවලට අදාළ පසුබිම් )ඉදිරිපත් කිරීමේදී කතුවරයා ඊට දක්වා ඇති සමත්කම් හා දුර්වලතාව පිළිබඳ සදය විවේචනාත්මක අදහස් දැක්වීම.